ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ගුජරාට් **ආණ්ඩුකාරතුමා** සහ ගුජරාට් නියෝජ්‍ය මහ **ඇමතිතුමා**</u>

<u>ප්‍රමුඛ දූත පිරිසේ සංචාරය **(2026 පෙබරවාරි 04 සිට 07 දක්වා)**</u>

ගුජරාට් ආණ්ඩුකාර ශ්‍රී ආචාර්යා දෙව්රත් මැතිතුමා සහ ගුජරාට් නියෝජ්‍ය මහ ඇමති ශ්‍රී හර්ෂ සංඝවි මැතිතුමා ප්‍රමුඛ දූත පිරිස 2026 පෙබරවාරි 04 සිට 07 දක්වා වූ සිය ශ්‍රී ලංකා සංචාරය අවසන් කරමින් ඉන්දියාව බලා පිටත් විය. මෙම දූත පිරිස පූජනීය දෙව්නිමෝරි සර්වඥ ධාතූන් වහන්සේලා රැගෙන ශ්‍රී ලංකාවට පැමිණි අතර ජාත්‍යන්තර වශයෙන් ප්‍රථම වරට පැවැත්වෙන දෙව්නිමෝරි සර්වඥ ධාතු ප්‍රදර්ශනය මේ දිනවල ගංගාරාම විහාරයේ පැවැත්වේ.

සංචාරය අතරතුරේදී, දූත පිරිස පාර්ලිමේන්තු සංකීර්ණයේදී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මැතිනිය හමු වී පූජනීය ධාතූන් වහන්සේලා ඉමහත් ගෞරවයෙන් ශ්‍රී ලංකාවට පිළිගැනීම සම්බන්ධයෙන් ස්තුතිය පළ කළහ. දූත පිරිස විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා ද හමු විය. ආර්ථික, සංස්කෘතික සහ සංචාරක ක්ෂේත්‍රයන් තුළ සහයෝගිතාවය වර්ධනය කරගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවන්හි අවධානය යොමු විය.

එසේම, දූත පිරිස ශ්‍රී ලංකාවේ වෙසෙන ගුජරාට් සම්භවයක් ඇති ප්‍රජාව ද හමු විය. ගුජරාට් සම්භවයක් සහිත බස්නාහිර පළාත් ආණ්ඩුකාර හනීෆ් යූසුෆ් මහතා ද මෙම අවස්ථාවට එක් විය. දූත පිරිස ජාත්‍යන්තර බෞද්ධ

සම්මේලනය විසින් සංවිධානය කරන ලද “Friends of IBC Reunion” උත්සවය සඳහා ද සහභාගී වූ අතර කොළඹ සහ ඒ අවට සංස්කෘතික වටිනාකමකින් යුත් ස්ථාන වෙත ද සංචාරය කළේය.

මධ්‍ය ප්‍රදේශ් ආණ්ඩුකාර ශ්‍රී මංගුභායි සී. පටලේ මැතිතුමා සහ අරුණාචල් ප්‍රදේශ් නියෝජ්‍ය මහ ඇමති චව්නා මේන් මැතිතුමා ප්‍රමුඛ දූත පිරිසක් ලබන සතියේදී ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇත. මෙම පිරිස විසින් ධාතු ප්‍රදර්ශනය සමාප්ත කර පූජනීය දෙව්නිමෝරි ධාතුන් වහන්සේලා නැවතත් ඉන්දියාවට වැඩම කරවනු ඇත.

***

**කොළඹ**
***2026* පෙබරවාරි *07***